# හංසි හොඳ ළමයෙක්




කේ.පී. සුහස්නා රුනිති ගුණසේකර

# හංසි හොඳ ළමයෙක්

**කතා**

කේ.පී. සුහස්නා රුනිති ගුණසේකර
1 ශ්‍රේණිය D

ISBN 978-624-211-193-3

කෘතිය පළ කරන දිනය – 2026.05.10

# පිදුම

*අ යනු ආ යනු ගලපන්න....*
*කතන්දර අකුරු කරලන්න....*
*පොතක් එළි දක්වන්න...*
*ආදරෙන් ඔවදන් දුන්න.....*
*ගුරු මවුන් නමට පුද දෙන්නෙමි!*



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත් කරණ ව්‍යාපෘතිය නම්කළ හැකි ය.

දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි.

එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේම මාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.


***ශෂිකලා සේනාධීර***

**විදුහල්පති**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි.මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක ගමක ලස්සන ගෙදරක් තිබුණා.

ඒ ගෙදර පුංචි ගැණු ළමයෙක් එයාගේ අම්මායි තාත්තායි එක්ක සතුටින් ජීවත් වුණා.

මේ ගැණු ළමයාගේ නම හංසි. එයා ඉගෙන ගන්න හරිම දක්ෂයි.



නිතර ම පොත්පත් කියවනවා. පොත්වල වැඩ කරනවා. පාඩම් කරනවා.

දවසක් හංසිගේ ගෙදරට තාත්තා පරිගණකයක් ගෙනාවා.

ඒක ගෙනාවෙත් පුංචි හංසිගේ පාසල් වැඩවලට පහසුවෙන්න. හංසිට හරිම සතුටුයි.

ඔහොම ටික කාලයක් ගත වුණා. හංසි පාසල් ඇරිලා ගෙදර එන්නේ පරිගණකයේ වැඩ කරන්න ආසාවෙන්.

එයා හවස් කාලය ම පරිගණකය එක්ක ම තමයි හිටියේ.

ටික කාලයක් ගත වුණා.

හංසිට පාසල් වැඩවලට තියන උනන්දුව අඩු වුණා. නිතරම තද හිසේ කැක්කුමක් නිසා හංසී අසනීප වෙන්න ගත්තා.

ඒ විතරක් නෙමෙයි. හංසිට විභාගවලින් ලකුණුත් අඩු වුණා.

හංසි ව වෛද්‍යවරයෙක් වෙත යොමු කරන්න අම්මායි තාත්තායි තීරණය කලා.



වෛද්‍යවරයා හංසි ව පරීක්ෂා කරලා බැලුවා. හංසිගෙන් තොරතුරු විමසුවා.

"නිතරම රූපවාහිනීය, පරිගණකය ඉස්සරහ ඉන්නවා ද?"

වෛද්‍යවරයා ඇසුවා.

"ඔව්, මම පරිගණකයේ කාටූන් බලන්න හරිම කැමතියි."

හංසි පිළිතුරු දුන්නා.



"ඒක තමයි පරිගණකය ඉදිරියේ වැඩි වේලාවක් හැමදාම ඉන්න නිසා තමයි මේ අසනීප වෙලා තියෙන්නෙ"

වෛද්‍යවරයා කිව්වා.බෙහෙත් නියම කලා.

හංසි අම්මායි තාත්තායි එක්ක ගෙදර ආවා. බෙහෙත් බිව්වා.

"අම්මේ , තාත්තේ මම ආයෙත් පරිගණකය බලන්නේ නෑ. පොත් කියවන්න පටන් ගන්නවා."

හංසි අම්මාටයි තාත්තාටයි කිව්වා.

හංසී ආයෙත් ඉස්සර වගේ ම පාඩම් පොත් කතන්දර පොත් එක්ක කාලය ගත කලා.

එයා විභාගවලින් හොඳ ලකුණු ගත්තා. අම්මාටයි තාත්තාටයි හරි සතුටුයි.



"දුවේ, පරිගණකය නරක දෙයක් නෙමෙයි. ඒත් අපේ වැඩවලට බාධාවක් නොවෙන්න ඒක පාවිච්චි කරන්න අපි දැන ගන්න ඕන"

තාත්තා ආදරයෙන් කියා දුන්නා.

හංසි ඒ ඔවදන් හිතට ගත්තා.



හංසි පරිගණකය එක්ක වගේ ම පොත් එක්ක කාලය සමබර ව ගත කරන්න පුරුදු වුණා.

☺☺☺☺☺



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි

මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පතිනිය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු

***සෙනෙවිරත්න මහලේකම්***
***( ව්‍යාපෘති නිර්මාතෘ)***